රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | **இணைந்த சேவைகள் பிரிவு** | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන
தொலைபேசி:**(94) 011- 2694560**
Telephone

ෆැක්ස්
தொலைநகல்:**(94) 011- 2692254**
Fax

ඊ-මේල්
மின்னஞ்சல்:**dgcs@pubad.gov.lk**
E-mail

වෙබ් අඩවිය
இணையத்தளம்: **www.pubad.gov.lk**
Web Site

මගේ අංකය / எனது இல / My No: R/DO/PER.APP/2020

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2020.03.12

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**2018.08.20 දින බඳවාගත් අභ්‍යාසලාභී උපාධිධාරීන් සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත්කිරීම - 2020**

2018.08.20 දින බඳවාගෙන අභ්‍යාසලාභී පුහුණුව වසරක් සම්පූර්ණ කර අදාළ සුදුසුකම් සපුරා තිබීම නිසා සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියට පත්කරන ලද නිලධාරීන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල සේවය සඳහා වාර්තා කිරීමට නියමිතය. එම නිලධාරීන් 2020.03.16 දිනට හෝ ඊට පෙර අනුයුක්ත කරන ලද සේවා ස්ථානයේ රාජකාරී භාරගත යුතුය.

02. සේවයට වාර්තා කළ පසු, එම නිලධාරීන්ගෙන් රාජකාරී භාරගත් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති පරිශිෂ්ඨය 03 එක් පිටපතකින් හා පරිශිෂ්ඨය 04 පිටපත් දෙකකින් සම්පූර්ණ කර ලබා ගත යුතුය. එහිදී රාජකාරී භාරගත් දිනය නිවැරදිව සඳහන් කළ යුතුවේ.

03. 2020.03.16 දින හෝ ඊට පෙර රාජකාරී භාරගන්නා නිලධාරීන්ගේ පත්වීම 2020.01.01 දින සිට බලපැවැත්වෙන අතර ඊට පසුව රාජකාරී භාරගන්නා නිලධාරීන් පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා කටයුතු කළ යුතු බැවින් එම නිලධාරීන්ගේ නාමලේඛනයක් (නිලධාරියාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ පත්වීම් අංකයද ඇතුළත්) රාජකාරී භාරගත් දිනය ද නිවැරදිව සඳහන් කර මා වෙත ලබාදෙන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

04. ඔබ ආයතන වෙත අනුයුක්ත කරන ලද නිලධාරීන් සුදුසු පරිදි ප්‍රධාන කාර්යාලවල සහ උපකාර්යාල වල පුරප්පාඩු පවතින සේවා ස්ථාන වලට අනුයුක්ත කිරීම සුදුසු වන අතර නිලධාරීන් පදිංචි දිස්ත්‍රික්කය තුළම සේවා ස්ථානවලට අනුයුක්ත කිරීම අත්‍යාවශ්‍ය නොවේ. එහෙත් නිලධාරීන්ගේ පෞද්ගලික අපහසුතාද සැලකිල්ලට ගෙන වඩාත් පහසු සේවා ස්ථානයකට අනුයුක්ත කිරීම සුදුසු වේ.

05. මෙම නිලධාරීන් සඳහා පත්වීම් ලබාදීමේ සහ අනුයුක්ත කරන ලද සේවා ස්ථාන සංශෝධනය කිරීමේ කටයුතු සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ විධිමත් අනුමැතිය ලබා ඇති බවද කරුණාවෙන් සලකන්න.

එස්. ආලෝකබණ්ඩාර,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.